## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.06.26

වේලාව : පෙ.ව.11.40

බළන්ගොඩ නගර සභාවේ ගරුසභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නගර සභා මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 03. ගරු නගර සභා මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නගර සභා මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 06. ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 07. ගරු නගර සභා මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. නාගරික ලේකම් | ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදනා:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2009 වර්ෂයේ ජුනි මාසයට අදාළ මහ සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම් මහතා,පුවත්පත් කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, උතුරේ අවතැන් වූවන් ජීවත්වන කඳවුරුවල කසල කළමනාකරණය කිරීමේ වැඩ සටහනක් සැකසීම සඳහා ලර්න් ඒෂියා ආයතනය විසින් මෙම නගර සභාවට සම්බන්ධවන ලෙස ආරාධනා කල බැවින්, 2009 ජුනි 24,25 දෙදින එම කඳවුරු නිරීක්ෂණය කිරීමේ චාරිකාවක යෙදුණු නිසා නියමිත දිනයේ දී සභා රැස්වීම පැවැත්වීමට නොහැකි වූ බව සඳහන් කරමින් ඒ සම්බන්ධව පළමුව සිය කණගාටුව ප්‍රකාශ කරන බව දැන්වීය.

තවදුරටත් කථා කල ගරු සභාපතිතුමා, උතුරේ අවතැන් වූ ජනතාවට පළාත් පාලන ආයතන වලින් යම් කිසි මෙහෙවරක් ඉටුකිරීමට අවශ්‍ය නම් ඒ සඳහා හොඳම අවස්ථාව මෙය වන බවත්, රජය මගින් ඔවුන්ට අවශ්‍ය ආහාර , ඇඳුම් පැළඳුම් ලබාදීමට කටයුතු කර ඇති අතර, කැලිකසල හා ජල ප්‍රශ්ණය විසඳිය යුතුව තිබෙන බව දැන්වීය. ඉදිරියේ දී පළාත් පාලන ආයතනයන්ගේ සංසදය සමග සාකච්ජා කොට දිවයිනේ පළාත් පාලන ආයතන 330 එකතුව මාස 03 ක කාලයක් කැලිකසල කළමනාකරණය කරගැනීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට අදහස් කරගෙන සිටින අතර, පළමු කණ්ඩායමට සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන නියෝජනය කරවීමට බලාපොරොත්තු වන බවත් පැවසීය.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංය මගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් හරිත රැකියා සම්මානය හා සබරගමුව පළාතේ හොඳම පුස්තකාලයට හිමි සම්මානය මෙම නගර සභාවේ මහජන පුස්තකාලයට හිමි වූ බව සතුටින් දන්වන අතර, මෙම සභාවේ කටයුතු මේ ආකාරයට ඇගයීමට , ගෞරවයට පාත්‍රවීම සම්බන්ධව අප සියළු දෙනාටම ආඩම්බර විය හැකි බව දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **<u>2009.05.29 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා කථා කරමින්, 2009.05.29 වන දින පැවැති මහ සභා රැස්වීමේ වාර්තාවේ වෙනත් කරුණු යටතේ තමන් කල කථාවේ " දුටු ගැමුණු පරාක්‍රමබාහු වැනි නරපතීන් එදා මේ මව්බිම බේරාගත්තා සේම, මහින්ද රාජපක්ෂ ශ්‍රේෂ්ඨ නායකයා ද මේ රට සතුරන්ගෙන් බේරාගත් බවත්, එබැවින්, රාජපක්ෂ පරපුර මේ රටේ යාවජීව පරපුරක් විය යුතු බව අවධාරණය කරමින් සිය කථාව අවසන් කරන ලදී." යනුවෙන් සඳහන්ව ඇති බවත්, එය දුටු ගැමුණු පරාක්‍රමබාහු වැනි නරපතීන් එදා මේ මව්බිම බේරාගත්තා සේම, මහින්ද රාජපක්ෂ ශ්‍රේෂ්ඨ නායකයා ද මේ රට සතුරන්ගෙන් බේරාගත් බවත්, එබැවින්, රාජපක්ෂ පරපුර මේ රටේ යාවජීව ජනපති පරපුරක් විය යුතු බව අවධාරණය කරමින් සිය කථාව අවසන් කරන ලදී." යනුවෙන් සංශෝධනය විය යුතු බව දැන්වීය. එම සංශෝධනයට යටත්ව 2009.05.29 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) <u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05 **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **නව වෙළඳ සංකීර්ණය සඳහා විදුලිය සැපයීම**

බළන්ගොඩ නව බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර වල නිතර නිතර විදුලිය විසන්ධිවීම සිදුවන නිසා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයක් පැන නැඟී ඇති බව දන්වමින්, බළන්ගොඩ ,බස්නැවතුම්පල ,සරණ ව්‍යාපාරක සංසදයේ ලේකම් විසින් ඉදිරිපත් කර ඇති 2009.06.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

විදුලිය විසන්ධිවන අවස්ථා වලදී විදුලිය ජෙනරේටය ක්‍රියාකරවීමට අවශ්‍ය කටයුතු කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

05:02 **ලී බඩු වෙළඳපල හා ප්‍රදර්ශනය:**

මොරටුව,මොරටුමුල්ල වඩු කාර්මිකයින්ගේ සුභ සාධක සංගමයට ආධාර පිණිස මොරටු ලී බඩු වෙළඳ ප්‍රදර්ශනය හා වෙළඳපල 2009.06.30 දින සිට 2009.07.10 දින දක්වා බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිට්යෙහි පැවැත්වීමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා , මොරටුව,මොරටුමුල්ල වඩු කාර්මිකයින්ගේ සුභසාධක සංගමයේ ලේකම් විසින් එවා ඇති 2009.06.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , බලපත්‍ර ගාස්තුව, ක්‍රීඩාපිට්ය කුළියට ලබාදීමේ ගාස්තුව හා රු.200000/- ක ඇප තැන්පතුවක් ලබාගෙන මේ සඳහා අවසර ලබාදීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:03 **ඉදිකිරීම් යන්ත්‍ර භාවිතය සම්බන්ධ එක් දින පුහුණු වැඩමුළුව**

ඉහත සදහන් කරුණට අදාළව සෙනොක් ට්‍රේඩින් කම්බයින් ලිමිටඩ් ආයතනයේ පුහුණු කළමණාකරු විසින් එවා ඇති 2009.06.19 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය තාක්ෂණික දැනුම හා හැකියාව ඔප්නැවීම අරමුණු කොට ගෙන එක් දින පුහුණු පාඨමාලාවක් සකස් කර ඇති අතර, එම පාඨමාලාව 2009 ජුලි මස 30 වැනි දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින්, ඒ සඳහා මෙම ආයතනයෙන් සහභාගීවීමට අපේක්ෂා කරන නිලධාරීන්ගේ විස්තර 2009 ජුලි 20 වැනි දිනට පෙර ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

පාඨමාලා ගාස්තුව රු.3080/- ක් ගෙවා මෙම පාඨමාලාව සඳහා වැඩ අධිකාරී මහතා සහභාගීකරවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **කඩ කාමර තක්සේරු කිරීම** - ( පොදුවෙළඳසල/මැණික් කඩ/සාප්පු කඩ)

2009.06.18 වන දින මෙම සභාවේ පැවැති මුදල් කමිටු රැස්වීමේ දී ඉහත කඩ කාමර වල බදු කුළිය තක්සේරු කිරීමට තීරණය වු බැවින්, ඒ සඳහා සභාවේ අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම කඩ කාමර තක්සේරු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **බළන්ගොඩ , හපුතලේ පාර අංකඃ 162/ඒ දරණ දේපළ තක්සේරු ලේඛනයෙන් ඉවත්කිරීම**

උක්ත කරුණට අදාළව , විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ , හපුතලේ පාර අංකඃ 160 දරණ කඩ කාමරයට යාබ කුඩා කොටසක දැනට වර්ෂ කිහිපයකට පෙර ස්වර්ණාභරණ තනන ස්ථානයක් පවත්වාගෙන ගිය අතර, පාර පළල්වීමත් සමඟ එම කොටස් කඩා ඉවත් කල බව දැනගැනීමට ලැබුණු බවත්, එම ස්වර්ණාභරන නිපද වු කොටස හපුතලේ පාරේ අංකඃ 162/ඒ යටතේ දැනට තක්සේරු ලේඛනයේ ලේඛනගතව ඇති බැවින්, හිඟ වරිපනම් අයකර මෙම දේපල 2009 වර්ෂයේ සිට තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සුදුසු බව එමගින් වාර්තා කර තිබුණි.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, හිඟ වරිපනම් බදු අයකරගැනීමෙන් අනතුරුව , මෙම දේපල තක්සේරු ලේඛණයෙන් ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 **කිරිදිගල ටැංකිය අසලින් ඇති මාර්ගය සම්බන්ධවයිඃ**

ඉහත සඳහන් කරුණට අදාළව, බළන්ගොඩ , කිරිදිගල ගම්වාසීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම මාර්ගය අවහිර වන ආකාරයට කඩ කාමරයක් ඉදිකර ඇති නිසා මාර්ගය පටු වී ඇති බව වැඩ අධිකාරී මහතා සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී තිබුණි.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, මෙම අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:06 **සතිපොළ ඉදිකිරීම -1 අදියර**

උක්ත කරුණට අදාළව, සෑම් ඩෑම් කොන්ත්‍රාත් ආයතනය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

සතිපොළ ඉදිකිරීම් කටයුතු ආරම්භක අවස්ථාවේ දී කරන ලද නිරීක්ෂණය අනුව , අදාල භුමිය මද බෑවුමක් සහිත බැවින් ද නිතර තෙතමනය සහිත ප්‍රදේශයක් බැවින් මෙන්ම, ගොඩනැගිලි වල නිමාව සලකා බැලීමෙන් ද

අනතුරුව යෝජිත ගොඩනැගිලි වල D.P.C මට්ටම මදක් ඉහළට රැගෙන ඒමට උපදේශක ඉංජිනේරු මහතා විසින් ලබාදුන් උපදෙස් අනුව, කටයුතු කිරිමේ දී පහත දැක්වෙන අයිතමයන් ප්‍රමාණ බිල්පත්‍රයේ ප්‍රමාණයන් අභිබවා යනු ඇති බවත්, අත්‍යාවශයෙන්ම කල යුතු පහත සඳහන් අයිතමයන් සඳහා අමතර මුදලක්ගෙවීමට සිදුවන බව එමගින් වාර්තා කර තිබුණි.

1. පස් කැපීම සහ පිරවීම
2. කොලම් කොන්ක්‍රීට් සහ කම්බි
3. අත්තිවාරම් බැම් සහ G.I.බට ( 3" )

මේ සම්බන්ධව විධායක ඉංජිනේරුවරයාගෙන් උපදෙස් ලබාගැනීමටත්, ඇස්තමේන්තුව ඇතුළත ගෙවීම් කටයුතු කිරීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **ප්‍රමාණ බිල්පත්‍ර හා ඇස්තමේන්තු සකස් කිරීම**

නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන ප්‍රමාණ බිල්පත්‍ර හා ඇස්තමේන්තු සකස් කිරීමේ පුහුණු වැඩ මුළුව සඳහා කාර්මික නිලධාරී එම්.කේ.ජේ.නිශ්ශංක මහතා සහභාගීකරවීමටත්, පාඨමාලා ගාස්තුව වන රු.11,000/- කමුදල සභා අරමුදලින් දැරීමටත් අනුමැතිය පතමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල පාඨමාලා ගාස්තු වන රු.11,000/- ක මුදල සභා අරමුදලින් දරා කාර්මික නිලධාරී එම්.කේ.ජේ.නිශ්ශංක මහතා උක්ත පුහුණු පාඨමාලාවට සහභාගීකරවීමටත්, මේ සඳහා පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමටත් සභාව තීරණය කරන ලදී.

05:08 **නිවාඩු අනුමත කිරීම - ගරු උපසභාපති, සුමේද චමින්ද බස්නායක මැතිතුමාඃ**

තමා හදිසියේම අසනීප වු බැවින්, අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගීවීමට නොහැකි බව දන්වමින්, ගරු උපසභාපති,සුමේද චමින්ද බස්නායක මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

05:09 **නව බස්නැවතුම්පල කඩ කාමරයක් ලබාගැනීමඃ**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ , මෙගොඩ කිරිදිගල යන ලිපිනයේ පදිංචි උපාලි යන අය විසින් ඉදිරිපත් කර ඇති 2009.06.20 දිනැති ලිපිය සභාගත කරන ලදී.

නව බස්නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ ඇති කඩ කාමර වලින් තමා හට මාසික කුලී පදනම මත ටෙන්ඩර් පරිපාටියෙන් තොරව කඩ කාමරයක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සලකා බැලු සභාව , සභාව වෙත පවරාගෙන ඇති කඩ කාමර ටෙන්ඩර් කිරීම වාර කිහිපයක් සිදුකල නමුත්, ඉල්ලුම්කරුවන්

ඉදිරිපත් නොවන බැවින්, මෙසේ භාරගෙන ඇති කඩ කාමර මාස 03 ක තැන්පතුවක් ලබාගෙන අදාළ ටෙන්ඩර් මුදලට ලබාදීමට තීරණය කරන ලදී.

05:10 **සභාපති හා නාගරික මන්ත්‍රීවරුන්ගේ අරමුදලः**

සභාපති හා නාගරික මන්ත්‍රීවරුන්ගේ අරමුදල සඳහා 2006 වර්ෂයේ සිට මේ දක්වා ලැබී ඇති මුදල් පිළිබඳ විස්තරයක් ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරි විසින් ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව ලේකම් මහතා විසින් දන්වන ලදී.

| | | | |
|---|---|---|---|
| 01. | එල්.ආර්.සුමිත් මයා | රු. | 2500.00 |
| 02. | ඒ.වී.මංජුල මයා | | 2500.00 |
| 03. | නෝමන් ලෝරන්ස් මයා | | 5000.00 |
| 04. | සරත් කුමාරසිංහ මයා | | 2500.00 |
| 05. | චින්තක කුලතුංග මයා | | 2500.00 |
| 06. | ජී.වී.ප්‍රියන්ත මයා | | 2500.00 |
| 07. | ටී.ජී.එල්.මෛත්‍රීපාල මයා | | 2500.00 |
| 08. | ජයන්ත ප්‍රේමසිරි මයා | | 2500.00 |
| 09. | නිරංජල උදේනික මයා | | 2500.00 |
| 10. | ඩබ්.කේ.අජිත් පාලිත මයා | | 2500.00 |
| 11. | කේ.එච්.අයි.කෝදාගොඩ මයා | | 2500.00 |
| 12. | ආර්.කේ.හීන්මහත්මයා මයා | | 2500.00 |
| 13. | ඩබ්.ජී.සිරිසේන මයා | | 2500.00 |
| 14. | ඩී.යෝගරාජා මයා | | 2500.00 |
| 15. | ඒ.කේ.ප්‍රදීප් කුමාර මයා | | 2500.00 |
| 16. | ටී.පී.ආර්.එල්.පෙරේරා මයා | | 2000.00 |
| 17. | එල්.ඒ.චන්ද්‍රසේන මයා | | 2500.00 |
| 18. | සරත් විජේගුණවර්ධන මයා | | 2500.00 |
| 19. | බී.ජී.චන්ද්‍රරත්න මයා | | 5000.00 |
| 20. | ප්‍රසන්න අමරබන්ධු මයා | | 10000.00 |
| 21. | මෙලඩන්ස් එන්ටර්ප්‍රයිසස් | | 10000.00 |
| 22. | ලාලිත රොෂාන් පෙරේරා මයා | | 2000.00 |
| 23. | ටීගෝ ලංකා පුද්.සමාගම | | 10000.00 |
| 24. | ඒ.ඉලේපෙරුම මයා | | 10000.00 |
| 25. | නියාස් හාජ්ජියාර් මයා | | 1000.00 |
| 26. | රුවන් භාග්‍ය ප්‍රියන්ත මයා | | 6000.00 |
| 27. | නිහාල් ජයරත්න මයා | | 13050.00 |
| 28. | ඩබ්.අයි.නයනසේකර මයා | | 7500.00 |
| 29. | රෝහිත පෙරේරා මයා | | 50000.00 |
| 30. | අජිත් විජයරත්න මයා | | 7500.00 |
| 31. | ඔක්ස්ෆර්ඩ් ඉන්ටර්නැෂනල් ආයතනය | | 7500.00 |
| 32. | එම්.අමරසේන මයා | | 6000.00 |
| 33. | සුරිඳු ලොරිරථ සංගමය | | 7500.00 |
| 34. | මොබිටෙල් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | | 500.00 |

| | | |
|---|---|---|
| 35. | සමනළ කුලී රථ සංගමය | 7500.00 |
| 36. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 7500.00 |
| 37. | කැළණි ඒජන්සීස් | 7500.00 |
| 38. | වජිර විජේකෝන් මයා | 7500.00 |
| 39. | ඩැක්ස් ඉංජිනියරින් | 100000.00 |
| 40. | එයාර් ටෙල් ලංකා පුද්.සමාගම | 7500.00 |
| 41. | එයාර් ටෙල් ලංකා පුද්.සමාගම | 86000.00 |

සභාපති අරමුදලින් ගෙවන ලද මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 01. | මාධ්‍යවේදීන් සඳහා ගෙවීම | 500.00 |
| 02. | -එම- | 1000.00 |
| 03. | -එම- | 1000.00 |
| 04. | නලීන් පුබුදු ගුණරත්න මයා | 100000.00 |
| 05. | දේශානි හාඩ්වෙයාර් | 6130.00 |
| 06. | ෆයිරූස් හාඩ්වෙයාර් | 3360.00 |
| 07. | අවතැන් වූ ජනතාවට ආධාර ලබාදීම | 30000.00 |
| 08. | ලංකා බැංකුව,නිවිතිගල | 1000.00 |
| 09. | බුද්ධි මංජුල තෙබුවන මයා | 4200.00 |
| 10. | මාධ්‍යවේදීන්ට ගෙවීම | 250.00 |
| 11. | චන්දන නිශාන්ත මයා | 9600.00 |
| 12. | මුදල් භාරකරු -එම්.මුතුමාල | 15000.00 |
| 13. | තාරුක ඇඩ්වර්ටයිසින් | 3000.00 |
| 14. | පෙර පාසල් දීමනා -2008 ජනවාරි සිට | 36000.00 |
| 15. | මුදල් භාරකරු ( සභාපති ) | 6000.00 |
| | | --------- |
| | | 473092.00 |

2009.06.25 දිනට ශේෂය රු.66589.61

## 05:11 විදුලි උපාංග මිළදී ගැනීම

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ විථි පහන් නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය පහත සඳහන් උපාංග මිළදි ගෙන ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, අවශ්‍ය උපාංග මිළදිගෙන ලබාදීමට සභාව අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| 01. | 100 W පිලිප්ස් විදුලි බුබුළු | 500 |
| 02. | 125 W ත්‍රීපින් මර්කරි විදුලි බුබුළු | 50 |
| 03. | 125 W චෝක් | 50 |
| 04. | 250 W මර්කරි විදුලි බුබුළු(ඩිරෙක්ට් විදුලි බුබුළු) | 20 |
| 05. | 40 W ප්ලෝරසන්ට් විදුලි බුබුළු | 25 |
| 06. | 40 W චෝක් ( ජර්මන් වර්ගය ) | 25 |
| 07. | ස්ටාටර් ( පිලිප්ස් ) | 50 |
| 08. | 1000 W හැලජන් සෙට් ( කම්ප්ලීට් සෙට් ) | 06 |
| 09. | ඉන්සුලේෂන් ටේප් රෝල් | 24 |
| 10. | හෝල්ඩර් ( සාමාන්‍ය ) | 48 |
| 11. | ටූපින් පෝසිලේන් හෝල්ඩර් | 25 |

| | | |
|---|---|---|
| 12. | ත්‍රීපින් පෝසිලේන් හෝල්ඩර් | 25 |
| 13. | තම්ලර් ස්විච් (ක්ල්ප්සාල් ) | 50 |
| 14. | S/L ෆිටින් සෙට්<br>( 125 W විදුලි බුබුළු (ඔස්රම්)<br>125 W චෝක්<br>ත්‍රීපින් පෝසිලේන් හෝල්ඩර්<br>ආර්ම් ) | 30 |
| 15. | 1000 W හැලජන් විදුලි බුබුළු | 06 |
| 16. | 1/044 වයර් රෝල් ඒ.එස්.එල්. | 04 |
| 17. | බයින්ඩින් කම්බි කිලෝ | 02 |
| 18. | කන්ඩියුට් පයිප්ප 3/4 බට | 25 |
| 19. | කන්ඩියුට් බෙන්ඩ් 3/4 | 25 |

05:12 **ගිනි නිවීමේ උපකරණ ලබාගැනීම**

මෙම නගර සභා කාර්යාලයේ ආරක්ෂාව පිණිස ගිනි නිවීමේ උපකරණ වල අවශ්‍යතාවක් පවතින බැවින්, ඒ පිළිබඳව වෙළඳ ආයතන වලින් විමසීමේ දී කාර්යාලයේ විශාලත්වය හා අවශ්‍ය ස්ථාන සම්බන්ධව සලකා බලා, කාර්යාලයේ ස්ථාන තුනකට සිලින්ඩර් 03 සවිකිරීම කලයුතු බව දන්වා තිබෙන බව සඳහන් කරමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, අලුතින් මිළදී ගැනීමක් සිදුකිරීම අවශ්‍ය නොවන බවත්, දැනට තිබෙන සිලින්ඩර් පිරවීමටත් තීරණය කරන ලදී.

05:13 **වරිපනම් බදු නිදහස් කිරීම - හපුතලේ පාර අංකඃ 125**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ, තුඹගොඩ,බළන්ගොඩ ස්ටෝර්ස් අංකඃ 125 දරණ ලිපිනයේ පදිංචි ජුඩ් සිල්වා මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ , හපුතලේ පාර අංකඃ 125 දරණ කඩකාමරය ( බළන්ගොඩ ස්ටෝර්ස් ) වර්ෂ දෙක තුනක සිට වසා දමා ඇති බැවින්, 2009 වර්ෂයේ වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අංක 125 දරණ කඩ කාමරය දැනට වර්ෂයක පමණ සිට වසා දමා ඇති අතර, මෙම ගොඩනැගිල්ල කඩා එම ස්ථානයේ අළුතින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරමින් පවතින අතර, හිඟ වරිපනම් බදු මුදලින් කොටසක් ගෙවා ඇති බව විෂය භාර නිලධාරි සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

2009 වර්ෂයේ වරිපනම් බදු නිදහස් කිරීමට තීරණය කරන ලදී.

5:14 **ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික ගාස්තු**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික ගාස්තුව පහත දක්වා ඇති අතර, එම ගාස්තුව ගෙවන ලෙස දන්වමින්,

ශ්‍රී ලංකා පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරක හේමන්ති ගුණසේකර මහත්මිය විසින් එවා ඇති 2009.06.10 දිනැති ලිපියෙහි යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව මෙම නගර සභාවට අදාළ වන රු.10000/- ක මුදල සභා අරමුදලින් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:15 නගර සභා ආඥා පනතේ 223 සහ 224 වගන්ති යටතේ බලතල පැවරීම සඳහා කරනු ලබන ඉල්ලීම:

බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අයත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරන තමා බළන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා නිවාඩු ලබාගන්නා අවස්ථාවලදී එම රාජකාරී කටයුතු ද ආවරණය කරන බවත්, නමුත්, නගර සභා බලප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍යයට අදාළ අණ පනත් යටතේ නෛතික කටයුතු ඉටුකිරීමට නගර සභා ආඥා පනත යටතේ තමා වෙත බලතල පැවරීමක් සිදුකර නොමැති බැවින්, අදාල බලතල පැවරීමක් සිදුකරන ලෙස ඉල්ලමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක එච්.රංජිත් සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

නගර සභා පනත අභිබවා බලය පැවරීමක් සිදුකල නොහැකි බව දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

## 05:16 සේවයට පැමිණ නැති බව දැණුම් දීම:

කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සේවය කරන සී.ජයන්ත නැමැති අය 2009.06.03 වන දින මේවන තෙක් සේවයට වාර්තා කර නොමැති බව දන්වා ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදුව, මෙම සේවකයා ස්ථිර සේවකයෙකු නොවන බැවින්, මෙය ගැටළුවක් නොවන බව දැණුම්දීමට තීරණය කරන ලදී.

## 05:17 බළන්ගොඩ නව බස්නැවතුම්පල - හිඟ කඩකුලී නොගෙවීම

බළන්ගොඩ නව බස්නැවතුම්පලේ කුලී පදනම මත බදු දී ඇති කඩ කාමර වල 2009.06.30 දිනට හිඟව පවතින කඩකුලී සම්බන්ධ වාර්තාවක් විෂය භාර නිලධාරී විසින් සභාවට ඉදිරිපත් කර තිබුණි.

මේ සම්බන්ධව සාකච්ඡා කළ සභාව, ඉල්ලුම්කරුවන්ගෙන් මාස 03 ක තැන්පතු ලබාගෙන නැවත බදු ලබාදීමට තීරණය කරන ලදී.

05:18 **වැය ශීර්ෂ මාරුකිරීම - 2009**

වැය ශීර්ෂ මාරුකිරීමට අදාළව විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| **ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය** | **විස්තරය** | **මුදල රු. ශත** | **ප්‍රතිපාදන ඉතිරි වැය ශීර්ෂය** | **විස්තරය** | **ඉතිරි මුදල රු. ශත** |
|---|---|---|---|---|---|
| 3-3-441 | අළුත්වැඩියා හා නඩත්තු( යන්ත්‍ර සූත්‍ර උපකරණ ) | 1,550,000.00 | 1-1-431 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 20,000.00 |
| | | | 1-1-481 | විශ්‍රාම වැටුප්(පළාත් පාලන විශ්‍රාමික) | 100,000.00 |
| | | | 1-2-411 | වැටුප් හා වේතන | 300,000.00 |
| | | | 1-3-431 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 30,000.00 |
| | | | 2-1-411 | වැටුප් හා වේතන | 200,000.00 |
| | | | 2-5-411 | වැටුප් හා වේතන | 500,000.00 |
| | | | 3-1-411 | වැටුප් හා වේතන | 200,000.00 |
| | | | 3-4-411 | වැටුප් හා වේතන | 200,000.00 |
| | | 1,550,000.00 | | | 1,550,000.00 |

| | **රු. ශත** |
|---|---|
| අයවැය ගත ඇස්තමේන්තුව | 950,000.00 |
| 2009.06.25 දක්වා වියදම් වූ ප්‍රමාණය | 1,698,841.99 |
| ඇස්තමේන්තුව ඉක්ම වූ වියදම | (748,841.99) |
| වැය ශීර්ෂ මාරුකිරිමෙන් ලැබෙන මුදල | 1,550,000.00 |
| වැය මාරුවෙන් පසු ඉතිරි ප්‍රතිපාදන | **801,158.01** |

මුදල් ඉතිරි වී ඇති වැය ශීර්ෂ වලින් මුදල් අවශ්‍ය වැය ශීර්ෂ වලට මුදල් මාරුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:19 2009 වර්ෂයේ පළාත් පාලන ක්ෂේපත්‍රයේ පුරෝගාමී අත්දැකීම් පිළිබඳ සමුළුව සහ පළාත් පාලන කළමනාකරණ ජාතික ත්‍යාග ප්‍රදානෝත්සවය 2009.08.12 සහ 13**

ඉහත සදහන් කරුණට අදාළව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ අංකයඃ පීඑල්/7/10/12 හා 2009.06.05 වන දිනැති එවා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

2009 අගොස්තු මස 12 හා 13 යන දෙදින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වීමට නියමිත පළාත් පාලන ක්ෂේත්‍රයේ පුරෝගාමී අත්දැකීම් එළිදැක්වීම පිළිබඳ ජාතික සමුළුව හා ප්‍රදර්ශණය සඳහා මෙම නගර සභාවෙන් විශිෂ්ඨ ක්‍රියාකාරකම් හුවා දක්වන අවස්ථාවන් පිළිබිඹු කෙරෙන ප්‍රදර්ශන කුටිය වෙනුවෙන් කොම්පෝස්ට් ව්‍යාපෘතියට අදාළව අයදුම්පත්‍රය සම්පුර්ණ කර ඉදිරිපත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:20 රජයේ රථවාහන රක්ෂණය කිරීම - ජාතික රක්ෂණ භාර අරමුදලඃ**

රජයේ සියළුම වාහන ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ රක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මහා භාණ්ඩාගාරයේ 13/03/2008 දිනැති අංකඃ පීඑෆ්/427(1) දරණ චක්‍රලේඛනය මගින් සියළුම රාජ්‍ය ආයතන වලට දැණුම් දී ඇත. ඒ අනුව මෙම සභාව සතු සියළුම වාහන රක්ෂණය කිරීම සඳහා වාහන වල වර්තමාන වටිනාකම සදහන් කල යුතුව ඇත. ඒ සදහා එම විෂය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති රථවාහන ඉංජිනේරයකුගේ සහය ලබාගැනීම සුදුසු බව වැඩ අධිකාරී මහතා විසින් වාර්තා කර තිබුණි.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව , සභාව සතු සියළුම වාහන වල වර්තමාන වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටුකරගැනීම අනුමත කරන ලදී.

**05:21 නිවාඩු අනුමත කිරීමඃ**

මෙම සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරයෙකු වන එම්.නිමල් කරුණාරත්න මැතිතුමා අසනීප වී රෝහල්ගත කර ඇති බව තමා වෙත දැණුම් දුන් බව ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දන්වන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

**05:22 වරිපනම් බදු නිදහස් කිරීම - හපුතලේ පාර අංකඃ 125**

උක්ත කරුණට අදාළව, බළන්ගොඩ, තුඹගොඩ,බළන්ගොඩ ස්ටෝර්ස් අංකඃ 125 දරණ ලිපිනයේ පදිංචි ජුඩ් සිල්වා මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ , හපුතලේ පාර අංකඃ 125 දරණ කඩකාමරය ( බළන්ගොඩ ස්ටෝර්ස් ) වර්ෂ දෙක තුනක සිට වසා දමා ඇති බැවින්, 2009 වර්ෂයේ වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අංක 125 දරණ කඩ කාමරය දැනට වර්ෂයක පමණ සිට වසා දමා ඇති අතර, මෙම ගොඩනැගිල්ල කඩා එම ස්ථානයේ අළුතින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරමින් පවතින අතර, හිඟ වරිපනම් බදු මුදලින් කොටසක් ගෙවා ඇති බව විෂය භාර නිලධාරි සිය නිරීක්ෂණ වාර්තාවෙන් පෙන්වා දී ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

2009 වර්ෂයේ වරිපනම් බදු නිදහස් කිරීමට තීරණය කරන ලදී.

06. **<u>මුදල් ගෙවීම් අනුමත කිරීම</u>** : ( රු.10000/- ට වැඩි ගෙවීම්)

2009.05.26 සිට 2009.06.17 දක්වා රු.10,000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | මුදල |
|---|---|---|---|
| 2009.05.26 | **රිචඩ් ෆ්‍රැන්සිස්**<br>බැංකියවත්ත කසල කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම හා තානායම අලුත් වැඩියාව වෙනුවෙන් වැලි ලබා ගැනීම.<br>**ඒකකයක ප්‍රමාණය**<br>**මිල**<br>රු3,750 x 5 | 81 | 18,750.00 |
| | **ෆයිරූස් හාඩ්වෙයාර්**<br>මල ප්‍රවාහන ප්‍රතිකර්ම පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා U චැනල් යකඩ බාර් මිලදී ගැනීම | 82 | 44,000.00 |
| 2009.05.29 | **U ඇන්ඩ් H වීල් සර්විස් (පුද්ගලික) සමාගම**<br>ND 5124 වෑන් රථයට 215-75 x 15 බ්‍රිජස්ටෝ ටයර් 04 මිලදී ගැනීම.<br>**ඒකක මිළ** **ප්‍රමාණය**<br>16402.40 x 4 | 83 | 65,609.60 |
| | **රෙජිස්ට්‍රාර් ජනරාල්**<br>2006.04.15 සිට 2007.12.31 දින දක්වා මුද්දර ගාස්තු උපලේඛණ පිළියෙල කිරීමේ ගාස්තු | 85 | 11,575.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>2009.04.27 සිට 2009.04.30 දක්වා ඉන්ධන බිල පියවීම.<br>**ඒකක මිළ** **ප්‍රමාණය**<br>**වටිනාකම**<br>ඩීසල් 70.20 876 61,495.20<br>එන්ජින් ඔයිල් 285 01 285.00<br>පෙට්‍රල් 120.20 34 4,086.80<br>ඩී.එස්.කෑන් 1558 02 <u>3,116.00</u> | | 68,983.00 |

| | | | |
|---|---|---|---|
| | එකතුව 8,983.00 | | |
| | **2009 ජූනි මාසය** | | |
| 2009.06.01 | මහජන බැංකුවේ අංක 6351750 ගිණුමට බැරවූ මුදල ආපසු 6352091 ගිණුමට බැර කිරීම. | 01 | 80,755.00 |
| | **ඉන්දික එරික් සිසිල්**<br>2009.05.13 දින මුතුරාජවෙල සිට බළන්ගොඩ දක්වා තාර බැරල් 30 ප්‍රවාහනය කිරිම වෙනුවෙන්. | 03 | 15,000.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**<br>රඳවා ගැනීමේ බදු මුදල් ප්‍රේශණය කිරීම. | 04 | 116,852.70 |
| | **කැළණි ඒජන්සිස්**<br>ගලිප්‍රතිකාරක පද්ධතිය සඳහා අගල් 2X slaugz වමපච එකක් ලබා ගැනීම. | 05 | 34,668.80 |
| 2009.06.02 | **සරණි පික්චර් පැලස්**<br>සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම.<br>**ඒකක මිළ ප්‍රමාණය**<br>**වටිනාකම**<br>ලංලෝ උදලු (9x9) 850 5 4,250.00<br>ලංලෝ ෂවල් 475 5 2,375.00<br>රේක්ක 245 3 735.00<br>වාකැති 480 3 1,440.00<br>පිහි 400 2 800.00<br>අලවංගු 4' 1600 2 3,200.00<br>ග්ලවුස් 25 20 500.00<br>13,000.00 | 06 | 13,300.00 |
| 2009.06.02 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>නාගරික මන්ත්‍රී දුරකථන බිල<br>2287023 - (2009/4) - 3,196.45<br>2452939 - (2009/2) - 1,250.51<br>2287022 - (2009/2-4) - 4,473.95<br>2288565 - (2009/2) - 888.84<br>2452931 - (2009/3) -2,204.90<br>2288400 - (2009/4) - 2,865.59<br>2287024 - (2009/4) - 860.05 | 07 | 15,740.29 |
| 2009.06.04 | **බී.ගුනරත්න**<br>2009.05.16 සිට 2009.05.31 දක්වා කසල ප්‍රවාහනය කිරිම සඳහා කම්කරුවන් යෙදවීම | 14 | 86,708.00 |
| | **එල්.කේ.හේමචන්ද්‍ර**<br>පත්වීම ස්ථිර කිරිම මත 2004 සැප්තැම්බර් මස සිට 2009 මැයි මස දක්වා හිග වැටුප් වර්ධක ගෙවීම. | 15-11 | 18941.00 |
| | **තාවකාලික වැටුප්**<br>2009 මැයි මස 18 සිට 31 දක්වා තාවකාලික වැටුප් | 15-14 | 116,500.00 |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම. | | |
| 2009.06.08 | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 මැයි මස කාර්යාලයීය විදුලි බිල පියවීම . | 17 | 15,625.50 |
| | **දේශානි හාඩ්වෙයාර්**<br>බැංකියවත්ත හා බළන්ගොඩ තානායමට අලුත් වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 21 | 15,194.00 |
| | **සෙවන ග්ලාස් හවුස්**<br>බස්නැවතුම්පල ගැහැණු හා පිරිමි විවේකාගාර සඳහා දොර ලොග් 02ක් තානායම සඳහා දොර ලොග් එකක් හා නගර සභාව සඳහා සහතික කිහිපයක් රාමු කිරීම. | 25 | 10,225.00 |
| | **නිව් ජෝති ස්ටෝර්ස්**<br>කාර්යාලයීය කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 26 | 22,480.00 |
| | **මයික්‍රෝ ඔටෝ එයාර් කන්ඩිෂනින්**<br>භඃ-5124 වෑන් රථයේ ්රැක පද්ධතිය අලුත් වැඩියා කර සේවා කිරීම. | 28 | 15,700.00 |
| | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්**<br>බස් නැවතුම්පල ඉදිරිපිට බැම්ම බැඳ දැල ගැසීමේ කර්මාන්තය හා ලේකම් නිල නිවාස ගේට්ටුව ඉදිකිරීම. | 29 | 28,620.00 |
| | **එම්.ජී.පියසේන**<br>2009.05.11 සිට 2009.06.04 දින දක්වා පෞද්ගලික බස්ගාල් වශයෙන් එකතු කරන ලද මුදලින් 15% තැන්පත් ගෙවීම. | 30 | 19,500.00 |
| | **සාමාන්‍යාධිකාරී, ලංකා විදුලි බල මණ්ඩලය**<br>2009 මැයි මස විදුලිය බිල පියවීම<br>පොදු වෙළඳසැල - 10,926.00<br>ප්‍රේක්ශකාගාරය - 435.00<br>එකතුව - 11,361.00 | 32 | 11,361.00 |
| 2009.06.10 | **එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස්**<br>තානායම, නගර සභා 4, 6, 8 නිල නිවස අලුත්වැඩියාව, බුලත්ගම සුසාන භූමිය වැසිකිලිය ඉදිකිරීම, බැංකියවත්ත නාන පීල්ල ඉදිකිරිම, කාර්යාලයේ වහල අළුත්වැඩියාව, බැංකියවත්ත වැඩබිමේ ඉදිකිරීම කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම. | 34 | 43,668.00 |
| | **ෆයිරූස් හාඩ්වෙයාර්**<br>බැංකියවත්ත මල් , එළවළු ආවරණය කිරීම සඳහා හට් එකක් ඉදිකිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම. | 37 | 21,900.00 |
| | **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**<br>2009 අප්‍රේල් මාසය සඳහා එකතු කල අගය මත | 38 | 84,071.60 |

| | | | |
|---|---|---|---|
| | බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම. | | |
| | **එම්.ඩී.ගුණසේන සහ සමාගම**<br>මහජන පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීම | 39 | 31,267.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br><br>**ඒකක මිළ ප්‍රමාණය වටිනාකම**<br><br>ඩීසල් 70.20 ලී.975 68,445.00<br>එන්ජින් ඔයිල් 1,620.00 ලී.05 කෑන්01 1,620.00<br>එන්ජින් ඔයිල් 285.00 ලී.කෑන් 02 570.00<br>පෙට්‍රල් 120.20 ලී. 79 9,495.80<br>ටූ-ටී 1/2 157.00 කෑන් 01 157.00<br>ටීපෝල් 130.00 කෑන් 02 260.00 | 40 | 80,547.80 |
| | **දෛනික වැටුප්**<br>පුස්තකාලය, කර්මාන්ත අංශය , සෞඛ්‍ය අංශය සඳහා දෛනික වැටුප් ගෙවීම - 2009 මැයි | 42-9 | 222,157.80 |
| | **සේවක අර්ථසාධක අරමුදල**<br>දෛනික වැටුප් පතින් සේවක අර්ථ සාධක ගෙවීම | 42-9 | 42,064.00 |
| 2009.06.12 | **කළමණාකරු - ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්**<br>ND 5124 වෑන් රථය 2009.06.04 සිට එක් වර්ෂයක් රක්ෂනය කිරීම | 43 | 108,304.11 |
| 2009.06.16 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br><br>දුරකථන බිල පියවීම (2009 මැයි)<br>2287275 - 6,691.55<br>2287153 - 4,430.44<br>2286596 - 4,289.97<br>2288737 - 7,573.42<br>ඊ-මේල් - 230.92<br>එකතුව- 23,216.30 | 49 | 23,216.30 |
| | **පලාත් ආදායම් කොමසාරිස්**<br>1% බැගින් අයකරණ ලද පිරිවැටුම් බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම. | 54 | 33,589.36 |
| | **කළමණාකරු - ජල සම්පාදන මණ්ඩලය**<br>2009 මැයි මස ජලබිල්පත පියවීම<br>පොදු වෙළඳසැල - 15,332.80<br>පිංතාලිය - 1,229.76<br>- 16,562.56 | 55 | 16,562.56 |
| | **සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය**<br>හිඟ මුදල් ගෙවීම - හෝරාස්ථම්බය | 56 | 30,392.50 |

| | | | |
|---|---|---|---|
| | **බී.ගුණරත්න**<br>2009.06.01 දින සිට 2009.06.15 දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහණය සඳහා කම්කරුවන් යෙදවීම. | 58 | 86,708.00 |
| 2009.06.17 | **සාමාන්‍යාධිකාරි , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>තානායම අලුත් වැඩියාව වෙනුවෙන් සිමෙන්ති මිටි 25 ලබා ගැනීම. (පැටවුම් කුලිය සමග)<br>මිටි 25 x එකක් 780 = 19,500/= | 59 | 19,500.00 |
| | **සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමිතිය**<br>2009.05.12 සිට 2009.05.19 දක්වා ඉන්ධන<br>**ඒකක මිළ ප්‍රමාණය**<br>**වටිනාකම**<br>ඩීසල් 70.20 ලී.911 63,952.20<br>එන්ජින් ඔයිල් 370.00 01 3 70.00<br>ග්‍රීස් 6878 15කි.ග්‍රෑම්.ටින් 01 6,878.00<br>පෙට්‍රල් ලී 120.20 80 9,616.00<br>ටූ-ටී ලී. 300.00 01 300.00<br>DS හයිඩ්‍රොලික් 1620 01 1,620.00<br>ලී.5 කෑන්<br>එකතුව 82,736.20 | 60 | 82,736.20 |
| | **මෙට්‍රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ්**<br>ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර් 06 ලබා ගැනීම.<br>රු.2576 X 6 = 15,456/= | 62 | 15,456.00 |
| | **ලංකා බැංකුව 2009.06.04 සිට** | | |
| 2009.06.04 | **සෑම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්**<br>බළන්ගොඩ සතිපොල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 20% ක අත්තිකාරම් මුදල් ගෙවීම. | 01 | 5,000,000.00 |
| 2009.06.10 | **ලංකා විදුලිබල මණ්ඩලය**<br>2009 මැයි මස නව බස්නැවතුම්පල විදුලි බිල පියවීම | 02 | 98,634.90 |
| | **දේශීය ආදායම් බදු කොමසාරිස්**<br>2009 අප්‍රේල් මස එකතු කල අගය මත බදු ගෙවීම. | 03 | 68,330.68 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම**

ඇස්තමේන්තු කිසිවක් සභාවට ඉදිරිපත් නොවීය.

08. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත

. **යථා පරිදි කල් දී ඇති යෝජනා**

නැත

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලිම:**

09:01 **විසිතුරු මල්පැල මිළදි ගැනීම**

නගර සභා කාර්යාල පරිශ්‍රයේ අංලකාරය සඳහා විසිතුරු මල්පැල මිළදි ගැනීමට කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| මල්පැල වර්ගය | ඉන්දික එරික් සිසිල් රු. ශත | රජිත ඇතුළත් මුදලි රු. ශත | ඒ.ඒ.ජයම් පති රු. ශත |
|---|---|---|---|
| රතුපාට මල් පැළ පෝච්චි 20 | 3100.00 | 3300.00 | 3200.00 |
| බුත්සරණ මල් පැළ 20 | 1000.00 | 1300.00 | 1000.00 |
| කනේරු පැළ 10 | 750.00 | 780.00 | 800.00 |
| රඹුටන් පැල 10 | 1000.00 | 1100.00 | 1100.00 |
| අඹ පැල 10 | 1000.00 | 1120.00 | 1130.00 |
| පිනි ජම්බු පැළ 10 | 1000.00 | 1120.00 | 1130.00 |
| පේර පැළ 01 | 100.00 | 108.00 | 110.00 |
| බෝන්විලා පෝච්චි 109 | 8175.00 | 8720.00 | 8938.00 |
| බෝන්විලා පැළ 23 | 1150.00 | 1265.00 | 1265.00 |
| බෝන්විලා ලොකු පෝච්චි 09 | 3600.00 | 3780.00 | 3825.00 |
| ඉද්ද පැළ 20 | 1000.00 | 1100.00 | 1300.00 |
| ෆාම් පොඩි පැළ 36 | 2700.00 | 2880.00 | 2952.00 |
| ෆාම් ලොකු පැළ 04 | 800.00 | 832.00 | 840.00 |
| විසිතුරු පැළ 158 | 7900.00 | 8690.00 | 9796.00 |
| ඇන්තුරියම් ලොකු පෝච්චි 68 | 30600.00 | 33660.00 | 35700.00 |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ඉන්දික එරික් සිසිල් යන අයගේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **J.C.B. යන්ත්‍රයට ටයර් මිළදි ගැනීම:**

J.C.B. යන්ත්‍රයට 12.5x80x18 ප්‍රමාණයේ ටයර් 02 ක් මිළදි ගැනීමට කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| ප්‍රමාණය හා වර්ගය | ටයර් ලංකා ට්‍රේඩින් කම්පැණි කොළඹ | ඔටෝ බොක්ස් ප්‍රයිවට් ලිමිටඩ් කොළඹ | යු ඇන්ඩ් එච්.වීල් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් |
|---|---|---|---|
| 12.5x80x18 Petlas ( Turkey ) ටයර් | 44150/- | 43120/- | 38191/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් " යු.ඇන්ඩ් එච් වීල් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් " ආයතනය අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති අතර, එම මිළ ගණන පිළිගැනීමටත් එම ආයතනයෙන් ටයර් 02 ක් මිළදී ගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:3 **බළන්ගොඩ නගර සභාවට කම්ප්‍රෙෂර සඳහා විදුලි මෝටරයක් මිළදී ගැනීම**

මෙම නගර සභාවේ කටයුතු සඳහා කම්ප්‍රෙෂරය සඳහා විදුලි මෝටරයක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| වර්ගය | කැළණි ඒජන්සීස් | ටී සිලෝන් හෝල්ඩින්ස් | ලංකා එක්ස්චේන් පු.ලි |
|---|---|---|---|
| කම්ප්‍රෙෂරය සඳහා විදුලි මෝටරය | 16430/- | 17400/- | 16900/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති කැළණි ඒජන්සීස් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

10. **යෝජනා**

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාః**

1. අතිගරු ජනාධිපතිතුමන්වෙත තවත් වසර 06 ක් ඡන්දයක් නොතබා බලයේ සිටීමට අවස්ථාව සැලසීම.

   වසර 30 ක් තිසසේ පැවති කුරිරු ත්‍රස්තවාදයෙන් ශ්‍රී ලංකාද්වීපය මුදාගැනීමට හැකි වූ නිසා අතිගරු ජනාධිපතුමා මුළු මහත් ලෝකයේම ප්‍රශංසාවට ගෞරවයට, පාත්‍ර වී තිබෙන බැවින් , එම අභිමානවත් සේවයට ගෞරව දැක්වීමක් වශයෙන් පාර්ලිමේන්තුවේ 2/3 බලය ලබාදී තවත් වසර 06 ක් ඡන්දයක් නොතබා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තව දුරටත් මේ රටේ ජනාධිපතිවරයා ලෙස පත්කිරීමට තමන් යෝජනා කරන බව දැන්වීය.

2. ඉසුරු උදාන තිලකරත්න නව යොවුන් ක්‍රිකට් ක්‍රීඩකයාට බළන්ගොඩ නගර සභාවේ උණුසුම් සුභපැතුම් පිරිනැමූ අතර, ඒ බව දන්වා යැවීමට යෝජනා කරන ලදී.

    ❖ මෙම ක්‍රීඩකයාගේ පුහුණුකරු වන සුසන්ත කුලරත්න මහතාට ද සභාවේ ගෞරවය හිමිවිය යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් දන්වන ලදී.

3. කාණු පවිත්‍ර කිරීම සදහා සෘජු කම්කරු ශ්‍රමය යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

මෙම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

11. **කාරක සභාවල වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරිමඃ**

2009.05.01 දින සිට 2009.05.25 දින දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව එම වාර්තාව සභා සම්මත විය.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම**

12:01 සේවාලාභී ප්‍රඥප්තිය හා 2010 වර්ෂය සදහා සකස් කර විගණන සැලැස්ම සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එම සේවාලාභී ප්‍රඥප්තිය හා විගණන සැලැස්ම අනුමත කරන ලදී.

12:02 2009 වර්ෂයේ මැයි මාසයට අදාළ ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 4,914,166.95 |
| වෙනත් ලැබීම් | 940,527.89 |
| | ------------- |
| මුළු ලැබීම් | 5,854,694.84 |
| පුනරාවර්ථන වියදම | 3,155,259.22 |
| වෙනත් වියදම් | 4,033,383.29 |
| | ------------- |
| මුළු ගෙවීම් | 7,188,642.51 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

## 13. වෙනත් කරුණු:

### 13:01 ගරු නාගරික මන්ත්‍රී - ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා:

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරවර අභාවප්‍රාප්ත මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා බළන්ගොඩ ආසනයට පමණක් නොව මුළු සබරගමුව පළාතටම සිදුකල සේවය අතිවිශිෂ්ඨ බවත්, එතුමා කළ සේවයට ගරු බුහුමන් දැක්වීම අපගේ යුතුකම වන බැවින්, බළන්ගොඩ නව බස්නැවතුම්පල සිට සතිපොළ මාර්ගය " මොහාන් එල්ලාවල මාවත " නමින් නම් කිරීමට තමන් යෝජනා කරන බව දැන්වීය.

වැඩිදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා පිට ප්‍රදේශ වලින් බළන්ගොඩ ප්‍රදේශයට පැමිණෙන ජනතාව අතරින් වැඩි දෙනෙකු දොරවෙල පිහිටි තුරු උයනෙහි නතර වී සිය ගමන් විඩාව නිම කර සතුටින් යන බව දක්නට

ලැබෙන නිසා මෙම තුරු උයන දිර්ඝ ලෙස සංවර්ධනය කිරීම සුදුසු වන බැවින් ඒ කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

නගරයේ මගී ජනතාවට හා රථ වාහන ගමනා ගමනයට බාධාවක් වන ආකාරයට ඇතැම් පදික වෙළඳුන් මාර්ගය අවහිර වන ආකාරයට වෙළඳාම් කටයුතු කරන බැවින් මේ සම්බන්ධව අවධානය යොමු කර ඔවුන් ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

### 1302 ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා:

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, මෙම සභාව විසින් සකස් කර ඇති තුරු උයනෙහි සංවර්ධනය හා අලංකාරය පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ඉතා අගය කරන අතර එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කරන ලෙස තමා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව පැවසීය.

මෙම දිනවල දිවයිනේ බොහෝ ප්‍රදේශවල ඩෙංගු වසංගතය සීඝ්‍රයෙන් පැතිරී යන බැවින්, එම වසංගතයෙන් ජනතාව ආරක්ෂා කරගැනීම සම්බන්ධව විශාල වගකීමක් පළාත් පාලන ආයතන වලට පැවරී තිබෙන හෙයින් මෙම සභාව ද ඩෙංගු රෝගය මර්ධනය සඳහා ධූමායන වැඩ සටහනක් පසුගිය දා ක්‍රියාවට නැංවූ බවත්, ඒ සම්බන්ධව සිය සතුට පළකරන අතර, නගරයේ කාණු පද්ධතිය පවිත්‍ර කරවීමට ද අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ දෙවට මාර්ගයේ ඇලට පස් කඩා වැටී ඇල මාර්ගය අවහිර වී ඇති බැවින්, එම අවහිරතාව ඉවත් කරන ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

13:03 **ගරු නාගරික මන්ත්‍රී - එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි කහටපිටිය මාර්ගය ඉතා අබලන් බැවින් එය සකස් කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

- ❖ නගරයේ වීථි පහන් නඩත්තුව නිසි පරිදි සිදුනොවන බැවින් ත්‍රීරෝද රථයේ සේවය සඳහා යොදවා ඇති විදුලි කම්කරු රංජිත් නිමලසේන මහතා ත්‍රීරෝද රථයේ සේවයෙන් නිදහස් කොට විදුලි පහන් නඩත්තු කිරීමේ කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

13:04 **ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, මෙම සභාවේ ගරු නාගරික මන්ත්‍රීවරයෙකු වන නිමල් කරුණාරත්න මැතිතුමා අසනීපව රෝහල්ගත කර බැවින්, එතුමාට ඉක්මන් සුවය ප්‍රර්ථනය කරන බව පළමුවෙන්ම පවසන ලදී.

මෙම නගර සභාව විසින් සකස් කර තුරු උයනෙහි අලංකාරත්වය හා එය වැඩිදුර සංවර්ධනය පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් ඉතා වටිනා අදහස් දැක් වූ අතර, ඇතැම් පිරිස් මෙම උයනෙහි අලංකාරත්වයට හානිවන ආකාරයට කටයුතු කරන බව දැනගැනීමට ලැබී ඇති බැවින්, ඒ කෙරෙහි අවධානය යොමු කර මෙහි ආරක්ෂාව තහවුරු කිරීමට විධිමත් පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

බුලත්ගම ජල ටැංකිය පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ ආරම්භ කිරීම සදහා ගිවිසුම් අත්සන්කර ඇති බැවින්, එහි වැඩ කටයුතු සාර්ථක කරගැනීම සදහා අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස තමා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව දැන්වීය.

අභාවප්‍රාප්ත සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමා ඉටුකළ මෙහෙවර කිසිදා මිල කළ නොහැකි වන අතර, එතුමා කල එම අභිමානවත් සේවයට ගරු කිරීමක් වශයෙන් බළන්ගොඩ නගරයේ මොහාන් එල්ලාවල පිළිරුවක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙසත්, එතුමාගේ නමින් බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණය නම්කිරීමට පියවර ගන්නා ලෙසත්, ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ නගර සභාව විසින් හඳුන්වා දී ඇති ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය අනෙකුත් පළාත් පාලන ආයතනයන්ට ආදර්ශයක් වී ඇති අතර, මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය උදෙසා සේවකයින් ලැබෙන සහයෝගය අතිවිශිෂ්ඨ බැවින්, ඔහුන්ගේ සේවය ස්ථිර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. අවසානයඃ

**ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.